14 වන පිටුවෙන් (අදිසි)

යති.

"මහත්තය අදම නුවර යන්නෙ නැහැනෙ..?" සුනන්ද ගේ මෝටර් රිය අසළ නැවතෙන පොඩි හාමුදුරුවෝ අසති. ".. යන්න කලින් පන්සල පැත්තෙ එන්න.. මට මහත්තය එක්ක කතා කරන්න දේවල් තියෙනවා.." පොඩි හාමුදුරුවන් වැකිය අවසන් කරන්නේ පන්සල් බිමට ඇතුල් වන නවීන පන්නයේ මෝටර් රිය දෙස බලාගත්වනම ය. ".. අයෝමා නෝනා..."

අයෝමා ගේ මෝටර් රිය සුනන්දගේ රිය අසළින්ම නැවතෙයි. රියැදුරා විසින් අරින ලද දොරෙන් අයෝමා වාහනයෙන් බසියි. තමා දකිත්ම ඇගේ ඇස් විස්මයෙන් කුඩා වී යනු සුනන්දට පෙනෙයි. ඇයට මුහුණ නොදී කල් ඇතිව පිටව යන්නට අවස්ථාවක් නොලැබීම පිලිබඳව සිතෙන් තැවෙමින් සුනන්ද ඇය වෙතින් සිය ඇස් ඉවත් කර ගනියි. මේ මාස කීපයට ඇය කොපමණ වෙනස් වී ඇද්ද..? කලෙක තමාගේ ආදරය දිනා සිටි නිරහංකාර අවිහිංසක තරුණියට කුමක් වී ද?

හැකි ඉක්මණින් මෙතැනින් පලා යා යුතු යයි සුනන්ද ගේ සිත කියයි. සුනන්ද පොඩි හාමුදුරුවන් දෙස බලයි. උන්වහන්සේ නිහඬව ම ආවාසය දෙසට ඇවිද යති.

"සුනන්දයියා.." ඇගේ හඬ පෙරදා මෙන්ම ගීතවත් ය. එහෙත් ඒ ආමන්ත්‍රණයේ එදා තිබූ ආදරණීය බව කොතැන සැඟවුණි ද? සුනන්ද සිය වාහනයේ දොර අල්ලා ගත්වනම ඈ දෙස හැරී බලයි. ඔහු බලාපොරොත්තු නොවූ ලෙස ඈ ඔහු අසළටම විත් නැවතෙයි. අපූරු විලවුන් සුවඳක් ඇය වෙතින් හමා එයි. අසන්නට පැණයක් හෝ කියන්නට යමක් හෝ සිතා ගත නොහැකිව ඔහු ඇය දෙස බලා සිටියි.

"කවද්ද ආවෙ..?" ඈ පහත් හඬින් අසයි.

"අදම ආපහු නුවර යනවද..?" ඔහුගෙන් පිළිතුරක් නොලැබෙන තැන ඕ නැවත අසයි. ඇය බොහෝ දේ දන්නා බව ඒ පැනය ඉඟි කරයි. ඒ කෙසේදැයි සිතන්නට හෝ ඔහු උත්සාහ නොකරයි. මේ තමා ආදරය කළ අයෝමා නොවන බව පමණක් ඔහුට වැටහෙයි. ඇය හා කතා බහක යෙදෙන්නට තරම් නිරවුල් බවක් තම සිතේ නැති බව ඔහුට දැනෙයි.

"මම යන්නං.." ඔහු වාහනයේ දොර අරියි. ඔහු පිලිබඳව උපන් අනුකම්පාව ඇගේ සිත පෙළයි. ඔහු හැර ගිය දා සිට සිත පෙළූ වරදකාරී හැඟීම නොදැනුවත්වම මතුව එයි.

"සුනන්දයියා... " ඇගේ පහත් හඬ ඔහුට ඇසෙන්නේ වාහනයට ගොඩ වන අතර ය. ".. මා එක්ක අමනාප වෙන්න එපා..."

ඔහු සුක්කානමට දෑත් තබාගත්වන ම ඇය දෙස හැරී බලයි. ඔහුගේ දෑසේ රැඳී ඇති තේරුම් ගත නොහැකි ගැඹුරු බැල්ම දරා ගත නොහැකි තරම් බරට ඇයට දැනෙයි.

"මං කා එක්ක වත් අමනාප නැහැ නංගි..." ඔහු මොහොතකට නවතියි. "..අපි කවුරුත් යන්නෙ අපි එක් එක්කෙනා වෙනුවෙන් හැදිල නියම වෙලා තියෙන පාරවල් වල .. අපි කැමති වුණත් නොවුණත් ඒක වෙනස් කරන්න අපට බැහැ.. ඔයා යන ගමන ඔයා යන්න.. ඒ ගමන හරිද වැරදිද හොයන්න දැං මං උත්සාහ කරන්නෙ නෑ..." ඔහුගේ හඬ පහත් නමුත් නිරවුල් ය. වම් අතින් ගියරය මාරු කරන ඔහු නැවත වතාවක් ඇගේ මුහුණ බලයි. "..මං යන්නං.."

000000000000

"තමුසෙට පොඩ්ඩක් මේ ඡන්දෙ ඉවරවෙනකල් ඉවසගෙන ඉන්න බැරි වුණානෙ රණසිංහ.." ප්‍රඥාරත්න ගේ දෑස් කෝපයෙන් දැවෙයි. එක එල්ලේ ඔහුගේ මුහුණ දෙස බලා සිටිනු නොහැකිව රණසිංහ බිම බලා ගනියි.

කාමරයේ සිටි පිරිසට ඉවත්වන්නැයි ප්‍රඥාරත්න කී ආකාරයෙන්ම ඔහු වැදගත් යමක් කියන්නට සැරසෙන බව රණසිංහ වටහා ගත්තේ ය. එනමුදු ඔහු මෙලෙස තමාගේ ඇඟට කඩා පනිනු ඇතැයි කිසි විටෙක ඔහු නොසිතුවේ ය.

"හැම දෙයක්ම කරන චාරයක් තියෙනවා මනුස්සයෝ.. චාරයක් තියෙනවා.." ප්‍රඥාරත්නට එක දිගට කතා කළ නොහැකි ය. කෝපය දරා ගත නොහැකිව ඔහු හති දමයි. ".. අපිත් කනවා.. බොනවා.. තව දේවලුත් කරනවා.. ඒත් ඒ හැමදේම කරන ක්‍රමයක් තියෙනවා.. ඡන්දයක් අත ළඟ තියාගෙන මෙයිට වඩා වගකීමකින් වැඩ කරන්න තිබ්බා තමුසෙට.."

දුරකතනය නොකඩවා නාද වෙයි. ප්‍රඥාරත්න එය විසන්ධි කරන්නේ ඇමතුම කාගෙන් ද කියා හෝ නොවිමසා ය.

"බලනවා.. දැං මං මහතැනට මොනාද කියන්නෙ..? තමුසෙට මේ පාර ටිකට් එක නොදෙන්නත් ඉඳලා මගේ රෙකමන්ඩේෂන් එකට තමයි වැඩේ කෙරුණෙ.. දැං බලනවා.. තමංගෙ සෙකට්‍රි කෙල්ලව ඡන්දාපේක්ෂකයා බඩ කළයි කියල පත්තර වලට ගියාම මොකද වෙන්නෙ ඕයි..? තමුසෙගෙ විතරක් නෙයි අපේ ඡන්ද ව්‍යාපාරෙටත් ඒක කොයි තරම් බලපානවද කියල තමුසෙ දන්නවද..?"

මේ කිසිදු පැනයකට දෙන්නට පිලිතුරක් රණසිංහ වෙත නැත. තිබුණද පිලිතුරු දෙන්නට යාමෙන් සිදුවන්නේ මේ මිනිසා තව තවත් කෝප ගැන්වීම පමණකි. නිහඬ වත සියල්ල විසඳනු ඇත.

"තමුසෙ වගේ බූරුවෙක් මං නං දැකල නෑ.."

ප්‍රඥාරත්න මේසය මත වූ වතුර වීදුරුව බොන්නේ එක හුස්මට ය. එයින්ම ඔහුගේ කෝපය නිවුණා සේ රණසිංහට පෙනෙයි.

"මං ඒ ප්‍රශ්නෙ කාටවත් නොදැනෙන්න විසඳගන්නං සර්.."

ප්‍රඥාරත්න රණසිංහ දෙස බලන්නේ අවඥාවෙන් බර වුණ දෑසිනි.

"තමුසෙට කරන්න පුලුවන් උලව්වක් නෑ ඕයි.."

"..සර්.."

"...තවත් මේක කූරු ගාලා හත් පොලේ ගාගන්නෙ නැතුව පැත්තකට වෙලා ඉන්නවා.. මං ඒක බලා ගන්නං.."

මීළඟ කලාපයට

13 වන පිටුවෙන් (එයාලට මාව අමතක වුනාට)

දරන්නට සිදුවුණා. නමුත් ප්‍රස්තුතයට හානියක් නොවන පරිදි සහ කතාව එක දිගටම ගලාගෙන යාමට හැකි වන පරිදි දර්ශන පෙළගැස්සීමට මා සමත් වුණා යයි මම විශ්වාස කරනවා.

ඒ වගේම ඒ ඒ චරිත වලට ගැලපෙන නලු නිළියන් තේරීම කළෙත් මමමයි. ඔවුන් තරුණ නලු නිළියන් වුණත් නියම මෙහෙයවීමක් ඔවුනට ලැබුණෙ නම් අවශ්‍ය කරන ප්‍රතිඵලය ඔවුනගෙන් ලබා ගන්නට හැකි වේ යයි මා තුළ විශ්වාසයක් තිබුණා. ඒක ඒ ආකාරයටම සිද්ධ වුණා.

එකමත් එක රටක සිනමාපටය පිළිබඳව ඔබ තෘප්තිමත් ද?

මට තිබුණ සම්පත් සහ මට තිබුණ පහසුකම් යටතේ මම තෘප්තිමත් වෙනවා. නමුත් මෙය මෙලෙස වුණා නම් හොඳ යයි සිතෙන අවස්ථාත් එහි නැතුවා නෙවෙයි. ඒ වගේම ඉදිරියේදී කරන නිර්මාණයකදී මේ නිර්මාණය තුළින් ලබාගත් ප්‍රායෝගික දැනුම සහ අඩුපාඩු සකස් කර ගැනීම පිළිබඳව මම නිරන්තරව කල්පනා කරනවා.

ඔබ රඟ පෑ විරූපී පුද්ගලයාගේ චරිතය ගැන..?

මේ චරිතය රඟපෑමේ අභියෝගය ජයගන්න වේශ නිරූපනය එක්තරා දුරකට උදව් වුණා. තිරකතා රචකයා හැටියට මට ඒ චරිතය ගැන හොඳ අවබෝධයක් තිබුණා. ඒ අවබෝධය මට විශාල පහසුවක් වුණා.

කේමදාසයන් ගේ සංගීතය ඔබේ සිනමා පටයට විශාල ආලෝකයක් ලබා දී තිබෙනවා.

මගේ සිනමාපටයට ගැලපෙන සංගීතය තමයි මට ලොකුම අභියෝගයක් වුණේ. මා වැනි ආධුනික නිර්මාණකරුවකුට කේමදාස මාස්ටර් වැනි ප්‍රවීණතම සංගීතඥයකු කෙරෙහි යොමුවන්න ඉඩක් තියේදැයි මම කල්පනා කරමින් සිටියා. නමුත් පසුව නොසිතූ මොහොතක එතුමා මුණගැසී කළ සාකච්ඡාවකින් පසු මගේ සිනමාපටය සංගීතවත් කරන්න එතුමා කැමති වුණා. එයින් මගේ නිර්මාණය ඉතා ඉහළ ස්ථානයකට එතුමා රැගෙන ගියා. එහි සාර්ථකත්වය දකින්න අද ඔහු ජීවතුන් අතර නැති වීම මට දැඩි වේදනාවක්. ඒ වේදනාව පාලුව මා මිය යන තෙක්ම මගේ හදවතේ කොණක රැඳෙන බව මට ඒකාන්තයි.

අද මේ සාකච්ඡාව කරන ජූලි 13 වන විට සිනමාපටයේ ප්‍රදර්ශණ ඉලක්ක සපුරාගෙන තිබෙනවාද?

මෙම නිර්මාණය දිහා පරිස්සමින් බැලුවොත් එය මුදල් ඉපැයීම පිණිස හෝ ආයෝජනය කළ මුදල් පහසුවෙන් නැවත ලබාගනු පිණිස හෝ නිර්මාණය නොකළ බව ඔබට පෙනේවි. ඒ වෙනුවෙන් මම කිසිම උපක්‍රමයක් හෝ යොදාගෙන නැහැ. මට තිබුණේ ප්‍රේක්ෂකයන් කෙරෙහි තැබූ විශ්වාසය පමණයි. ඒ විශ්වාසය මා බලාපොරොත්තු වූවාටත් වඩා ඉහළ ප්‍රමාණයකින් ලැබී ඇති බව මට දැනෙන විට මට විශාල සතුටක් දැනෙනවා. එය තවත් නිර්මාණයක් කරා මා යොමු කරවන ප්‍රබල සාධකයක්.

සනත් ගුණතිලක කියන නමත් එක්ක ඈඳුණ ප්‍රසිද්ධ කාන්තා චරිත රැසක් තිබෙනවා. මාලිනී ෆොන්සේකා සබීතා පෙරේරා වසන්ති චතුරාණී චන්ද්‍රිකා කුමාරණතුංග වගේ නම් .. මේ සියල්ල අතරේ ඔබ තවමත් අවිවාහකව ඉන්නවා. හෙට මොකක් වෙයි ද?

(සිනාසෙයි) ඔබට මගේ නම කියනකොට ඒ නම් මතක් වුණාට ඒ අයට මගේ නම මතක තබා ගන්න බැරි වීම ගැන කණගාටු විය යුත්තේ මා ද නැත්නම් ඒ අයද යන්න මට තවම ගැටලුවක්. මගේ නම දිගටම මතක තියාගන්න පුලුවන් කෙනෙක් හමුවුණොත් මගේ තනිකඩ දිවියත් එදාට කෙළවර වෙයි.


